www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

රාජකීය විද්‍යාලය - කොළඹ 07

# Royal College – Colombo 07

8 ශ්‍රේණිය - පළමු වාර පරීක්ෂණය - 2019

## Grade 8 – First Term Test– 2019

## Sinhala

සිංහල

කාලය - පැය 2

Name : ........................................................ Index No. : .................. Class . ...............

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

- ඉරි ඇඳි පදයේ අර්ථයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. " සිරිපාල කටුවට වහල්ලට නැති මිනිහෙක් " නන්නාඩුනනා ලෙස යන තම පැරණි මිතුරා දෙස බලා ගුණපාල කීවේ ය.
   1. කීකරුකමක් නැති
   2. ඉන්නට වහලක් නැති
   3. ඉතාමත් කෙට්ටු
   4. කිසිදු හොඳ ගුණයක් නොමැති

2. ආතක් පාතක් නැතිව ඉබාගාතේ යන අසරණ මිනිසුන්ට පිළිසරණ වෙමු.
   ඉහත ඉරිඇඳි පද අයත් වන්නේ,
   1. රූඪියකට හා ප්‍රස්තාව පිරුළකට ය.
   2. යුගල පදයකට හා ඉඟි වැකියකට ය.
   3. රූඪියකට හා ඉඟිවැකියකට ය.
   4. යුගල පදයකට හා ප්‍රස්තාව පිරුළකට ය.

3. රිද්මයානුකූල ප්‍රස්තාව පිරුළකට උදාහරණයකි.
   1. ආරේ ගුණ නැරේ
   2. ගලේ කෙටූ අකුර වගේ
   3. කුකුළු නින්ද
   4. යුද්දෙට නැති කඩුව කොස් කොටන්නද?

- හිස්තැනට වඩාත් සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

4. කාව්‍ය සාහිත්‍යාදි කලා රස විඳීමෙන් ............................... හදවතක් ඇත්තෝ සහෘදයෝ නම් වෙති.
   1. සියුම්
   2. සිනිඳු
   3. සුමට
   4. සුලලිත

5. කතා බහට සවන් දී ආචාරශීලීව ...................... දැක්වීමේ ගුණය ගැමි සමාජයේ මැනවින් පිළිබිඹු විය.
   1. ප්‍රතිවිපාක
   2. ප්‍රතිකර්ම
   3. ප්‍රතිචාර
   4. ප්‍රතිඋත්තර

6. දුක්ඛ වේදනාවන් , ජීවිතාවබෝධය පුළුල් කර වඩාත් ...................... ජීවන දර්ශනයක් තාගෝර්තුමාට ලබාදුන්නේ ය.
   1. විශාල
   2. පෘථුල
   3. සාර්ථක
   4. සංවේදී



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

7. වෙනත් බසක වචනවල අර්ථය පවසමින් සම්පාදිත ශබ්ද කෝෂ ................. වේ.
   1. භාෂාමය ශබ්දකෝෂ
   2. විස්තරාත්මක ශබ්දකෝෂ
   3. ජනශ්‍රැති ශබ්දකෝෂ
   4. භාෂාන්තර ශබ්දකෝෂ

8. ආකාරාදි පිළිවෙළට වචන දක්වා ඇති පිළිතුර වනුයේ,
   1. නිල්ල , නෙළන , නීල , නයන
   2. අමර , අගෙයි , අර , අරලිය
   3. කළු , කැකුළිගෙ , කිකිළි , කොමලි
   4. සුමන , සමන් , සුරිදු , සරණ

9. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන ඇති වරණය තෝරන්න.
   1. ජ්‍යෝෂ්ඨ , කණිෂ්ඨ , විශිෂ්ට , ශ්‍රේෂ්ඨ
   2. විශේෂ, අවශේෂ , සුවිෂේශ , ශේෂය
   3. වාර්තාව , පුස්තකාලය , පරිවර්තන , සමස්ත
   4. ළය , ළඳ , ලපළු , ලාමක

10. වැරදි අක්ෂර වින්‍යාස රීතිය තෝරන්න.
    1. 'ප' වර්ගයට අයත් අකුරකට මුලින් මූර්ධජ 'ෂ' අකුර යෙදේ.
    2. සියලු ම සමූහාර්ථවාචී පදවල මූර්ධජ ' ළ' කාරය යෙදේ.
    3. 'ර 'කාරයෙන් අවසන් වන වර්තමාන කාල ක්‍රියා ඇසුරෙන් බිහිවන අතීතකාල ක්‍රියාපදවල ඇත්තේ මූර්ධජ 'ළ' කාරයයි.
    4. 'ගණිනවා' යන අදහස ඇති නාම පදවල දක්නට ලැබෙන්නේ මූර්ධජ 'ණ' කාරයයි.

11. ස්වර බෙදා ඇති ආකාරය අනුව හ්‍රස්ව හා දීර්ඝ ස්වර ගණන පිළිවෙළින්,
    1. 08 හා 10 කි.
    2. 10 හා 08 කි.
    3. 12 හා 18 කි.
    4. 18 හා 12 කි.

12. 'ඤ' අකුරෙන් ඇරඹෙන වචන අකාරාදී පිළිවෙළට සැකසීමේ දී ඒවා යෙදෙන්නේ ............. අකුරු අතරටය.
    1. ච - ජ
    2. ජ - ඤ
    3. ඡ - ජ
    4. ඣ - ඤ

13. සියලු ම වචනවලට මහාප්‍රාණ අක්ෂර යෙදී නැති වරණය තෝරන්න.
    1. ගාථා , අර්ථය , ඝෝෂාව -, ශීඝ්‍ර
    2. ශ්‍රේෂ්ඨ , විශිෂ්ට , ප්‍රතිඵල , ඵලකය
    3. ඛාදනය , ආඛ්‍යාතය , ඡායාව , ඡන්දය
    4. භයානක , භේදය , ආඪ්‍ය , ආරූඪ



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

14.ව්‍යාකරණානුකූලව නිවැරදිව ලියා ඇති වාක්‍යය තෝරා යටින් ඉරක් අඳින්න.

1. අණ බෙර කරු රාජාඥාව නිකුත් කළේ ය.
2. ඇමතිවරුන් පුදුමයෙන් බලා සිටියෝ ය.
3. අශ්ව රථ වේගයෙන් ගමන් කළහ.
4. රජතුමා රටවැසියෝ ඇමතුවේ ය.

15. ව්‍යාකරණානුකූලව වැරදි ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.

1. වලාවෝ අහසේ අඳුරු පැහැ ගැන්වූහ.
2. හෙණ හඬ දෙසවන් බිහිරි කළහ.
3. ගස්වැල් ඒ මේ අත ඇඹරුණේ ය.
4. අහස් කුසින් ජල ධාරා ඇදහැළුණි.

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16.ජනකතාවල ලක්ෂණයක් නොවන්නේ,

1. උපදේශයක් ලබාදීම.
2. යෙදුම් බහුලව දැකිය හැකි වීම.
3. සරල බව හා අව්‍යාජ බව.
4. භාෂා නිපුණයින් විසින් නිර්මාණය කිරීම.

17.ශබ්ද මාධූර්යය ඇති කරවන කාව්‍යාලංකාර දෙකකි.

1. අනුප්‍රාසය , විරිත
2. උපමා , රූපක
3. අනුප්‍රාසය , රූපක
4. රූපක , විරිත

18. i. “ඉරු දෙව් බබළවයි පහන ........”
ii. “ගල්වා හිසෙහි තෙල් යහමින් ......”

ඉහත දක්වා ඇති කවි පාද ඇතුළත් කාව්‍ය දෙකෙහි රචකයන් කවුද?

1. කුමාරතුංග මුනිදාස මහතා , අරිසෙන් අහුබුදු සූරීන්
2. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි , එස්. මහින්ද හිමි
3. කුමාරතුංග මුනිදාසයන්, මහගමසේකරයන්
4. මහගමසේකරයන්, රැපියෙල් තෙන්නකෝන් මහතා

19.ජීවන සංක්‍රාන්ති උත්සවයකි.

1. අලුත් අවුරුදු උත්සවය
2. නත්තල් උත්සවය
3. වෙසක් උත්සවය
4. විවාහ මංගල උත්සවය



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

20. සාහිත්‍යය සඳහා නොබෙල් ත්‍යාගය ගැනීමෙන් පසු රබින්ද්‍රනාත් තාගෝර්තුමා ලොව ප්‍රසිද්ධ වූයේ කුමන අන්වර්ථ නාමයකින්ද?
 1. ඉන්දියානු අනන්‍යතාවයේ සංකේතය
 2. බෙංගාල මහා කවියා
 3. ආසියාවේ නියමුවා
 4. මහා යුග පුරුෂයා

(ලකුණු 2×20 = 40)

## II කොටස

**පළමු හා දෙවන ප්‍රශ්න අනිවාර්යය වේ. ඉතිරි ප්‍රශ්න වලින් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්න පහකි.**

**(01)** ඔබේ පංති කාමරයේ දී ප්‍රස්තාව පිරුළු ආශ්‍රයෙන් නිර්මාණය කරන ලද පොත් පිංච ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) ඔබ එම පොතට යොදන ලද නම කුමක් ද?
2) එම පොත නිර්මාණයේ දී ඔබ යොදා ගන්නා ලද ප්‍රස්තාව පිරුළු දෙකක් ලියා දක්වන්න.
3) මෙම පොත නිර්මාණය සඳහා ඔබ තොරතුරු සොයා ගත් මූලාශ්‍ර දෙකක් ලියන්න.
4) සන්නිවේදනයේ දුර්වලතා ඇසුරෙන් නිර්මාණය වූ ප්‍රස්තාව පිරුළක් ලියන්න.
5) ප්‍රස්තාව පිරුළුවලට අමතරව සිංහල භාෂාවේ යෙදෙන වෙනත් සම්ප්‍රදායික යෙදුම් වර්ග දෙකක් ලියන්න.
6) ඉහත දැක් වූ පොත නිර්මාණයේ දී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් දක්වන්න.
7) එම පොත නිර්මාණයේ දී ගුරුතුමිය දෙන ලද උපදෙස් දෙකක් සඳහන් කරන්න.
8) මෙම පොත් පිංච නිර්මාණයෙන් ඔබ ලද ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ලකුණු 2×8 = 16)

**(02)** පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.
1) ආචාරශීලීව කතාබහේ යෙදෙමු.
2) අපගේ සංස්කෘතිය පිළිබිඹු කරන අලුත් අවුරුදු උත්සවය.
3) ඉන්දියානු සාහිත්‍යය සඳහා කැපවුණු රබීන්ද්‍රනාත් තාගෝර් තුමා.
4) අසිරිමත් රාත්‍රිය.
5) සිංහල ජන කතා සාහිත්‍යය.

(ලකුණු 14)

**(03)** 1) ඔබගේ පාසල අවට පවතින අධික රථවාහන තදබදය නිසා පාසල් සිසුන්ට නියමිත වේලාවට පාසලට පැමිණීමට බාධා පැමිණේ. මේ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස විදුහල්පතිතුමා විසින් රථවාහන භාර පොලිස් අධිකාරිතුමාට යැවීමට සුදුසු ලිපිය ලියන්න

හෝ

මෙවර වෙසක් උත්සවය නිමිත්තෙන් ඔබ පාසලේ පැවැත්වීමට යන 'පහන්කූඩු නිර්මාණ ප්‍රදර්ශනය' පිළිබඳව පාසලේ බෞද්ධ සංගමයේ සභාපතිතුමා, ලේකම්තුමා හා භාණ්ඩාගාරිකතුමා බෞද්ධ සංගමයේ ප්‍රධාන අනුශාසක ස්වාමීන් වහන්සේ සමඟ පවත්වන සංවාදය ගොඩනගන්න.

(ලකුණු 10)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

(04) දොර කවුළු හැම වැසුණු දෙවොලක
කාට දෝ මේ පුදන්නේ
.......................................................
.......................................................

1) ඉහත කවියෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
2) මෙම කවිය රචනා කරන ලද්දේ කවු ද?
3) මෙම කවියෙහි අර්ථයට සමාන අර්ථයක් ඇති සිංහල ගීතයක් ඇත. එම ගීතයේ මුල් පද දෙක ලියන්න.
4) 'යත්‍ර විශ්වම් භවති ඒක නීඩම්' 'විශ්වය යම් තැනකද එය එකම කැදැල්ලකි' යන්න කුමන ආයතනයේ ආදර්ශ පාඨයක් ද?
5) ඉහත දී ඇති කවියෙහි රචකයාට 1916 වසරේ දී පිරිනැමූ පදවිය කුමක් ද?

(ලකුණු $2\times5 = 10$)

(05) පහත දී ඇති කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඈත පෙනෙන කඳු පාමුල
පිට්ටනියක හරක් කවන
පුංචි පුංචි ළමෝ පෙළක්
සෙල්ලම් කරති

ගන නිල් කොළ පිරුණු ගසක්
කිරි වතුරෙන් නාවන ලෙස
කඳු හිස් දවටා මීදුම්
පහළට බසිති

වත්ත පහළ ගහේ බැඳපු
බමර පෙත්ත හුළං වැදී
රුං ගා කැරකෙවෙන හඩින්
කුරුල්ලෝ යති

වලාකුළේ හැංගී ඉඳ
වැහි දෙවියන් විසින් එවන
සිරිපොද වැස්සෙන් නිතරම
කඳු හිස තෙමෙතී

1) මෙම කවි පංතියෙන් විස්තර වන්නේ කුමක් පිළිබඳව ද?
2) මෙහි ඇති උපමාවක් ලියා දක්වන්න.
3) එම උපමාව හා සම්බන්ධ උපමේය සඳහන් කරන්න.
4) මෙම කවි පංතියේ යෙදී ඇති ප්‍රථම පුරුෂ බහු වචන ක්‍රියා පද දෙකක් ලියන්න.
5) 'මේඝය' යන්නට සමාන පදයක් මෙම කවි පෙළෙහි යෙදී ඇත. එම වචනය කුමක් ද?

(ලකුණු $2\times5 = 10$)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

**(06)** පහත දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දොළහා කෙළියට වඩා පැරණි යැයි සිතිය හැකි පංච කෙළිය වර්තමානයේ ජන සමාජයෙන් ඈත්ව යන ක්‍රීඩාවකි. ඒ නිසා නූතන පරපුරෙන් බොහෝ දෙනෙකු මේ පිළිබඳව නොදනිති. මෙම ක්‍රීඩා දෙකටම පොදු හා අනන්‍ය ලක්ෂණ බොහෝ ඇත. දොළහා කෙළිය පංච කෙළියේ විකාශනයක් යැයි අනුමාන කිරීමට තරම් ඒවා අතර ඇති සමානතා හේතු වී ඇත.

පංච කෙළිය මෙන්ම දොළහා කෙළියද පත්තිනි දෙවියන්ගේ ක්‍රීඩාවක් ලෙස සැලකූ පැරැන්නෝ පංච පෙතට හා දොළහා පෙතට ගෞරව කළහ .ඒ මතින් යාම නොකළහ .එක් නිවසක පංච දැමීමක් හෝ දොළහා දැමීමක් වරක් කළොත් එය නොනවත්වා දින හතක් කළ යුතු යැයි පැරැන්නෝ අතර ආකල්පයක් විය .පත්තිනි දේවි හෝ එම සංකල්පය මෙරටට පැමිණියේ ඉන්දියාවෙනි .පංච කෙළිය හා දොළහා කෙළිය සමඟ බැඳුණු දමිළ වචනද ඇත . එහෙයින් මේවා ඉන්දියාවෙන් පැමිණියා විය හැක' .පංච 'යනු දෙමළෙන් බෙල්ලන්ට කියන නමකි .එහෙයින් ඉහත සැකය තවත් තහවුරු වන බව පෙනේ .යම් ආගමික විශ්වාස ක්‍රීඩාව හා බැඳුණ ද එය සිංහල අවුරුදු සමයේ එළි බහින ජන ක්‍රීඩාවක් වී ඇත.

1. ඉහත ඡේදයෙහි සඳහන් ජන ක්‍රීඩා දෙකක් නම් කරන්න.
2. පංච කෙළියේ විකාශනයක් ලෙස කුමන ක්‍රීඩාව බිහිවන්නට ඇතැයි අනුමාන කරයි ද ?
3. පැරැන්නෝ පංච පෙතට හා දොළහා පෙතට ගෞරව කළේ කුමක් නිසා ද ?
4. මෙහි සඳහන් ජන ක්‍රීඩා කුමන විශ්වාස හා බැඳී පවතී ද ?
5. පහත දී ඇති වචනවලට සමාන පද ඡේදයෙන් උපුටා ලියන්න.

   1. ආවේණික - ............................................
   2. ක්‍රීඩාව - ............................................

(ලකුණු 2×5 = 10)




agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

(07) ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




agaram.lk

පහළට

1. ' ගාත්‍රාක්ෂර ' සඳහා සමාන පදයකි.
2. ' නළ බල සසල දළ රළ පෙළ නුබ නැගෙන ' යන කවි පදයේ ඇති කාව්‍ය උපක්‍රමයයි.
3. 'පණුවා 'යන්නට සමාන පදයකි.
4. කළුවර පක්ෂයේ පසළොස් වැනි දිනයයි.

හරහට

1. ' අමාවතුර ' රචනා කළ කතුවරයාය.
3. පොල්තෙල් හිඳිනවිට ඉතිරිවන දියරය.
4. අක්ෂර මාලාව පෙළගස්වා ඇති සම්මත පිළිවෙළ හඳුන්වන වචනයයි.
5. නිපාත පද භාවිතයෙන් යමකට යමක් සමාන කිරීම මේ නමින් හඳුන්වයි.
6. පදාර්ථයක ඝනයටත් වායුවටත් අතර ස්වභාවය මේ නමින් හඳුන්වයි.
7. නිපාත පද භාවිතා නොකර යමකට යමක් සමාන කිරීම වේ.

(ලකුණු 1 ×10 = 10)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk